**ලංසු දැන්වීම**

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**
**ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ පේරාදෙණිය ශික්ෂණ රෝහලට අනුබද්ධ ගලහ ජාතික භික්ෂු මධ්‍යස්ථානය සඳහා පිරිසිදු කිරීමේ සේවය සැපයීම - 2025/2026**

2025/2026 වර්ෂයක කාලයක් සඳහා සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පේරාදෙණිය ශික්ෂණ රෝහලට අනුබද්ධ ගලහ ජාතික භික්ෂු මධ්‍යස්ථානයේ පිරිසිදු කිරීමේ සේවය සැපයීම පිණිස ලියාපදිංචි ආයතනවලින් පේරාදෙණිය ශික්ෂණ රෝහලේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ලංසු කැඳවනු ලැබේ.

**1. මෙම කොන්ත්‍රාත්තුව සඳහා පහත සඳහන් මූලික සුදුසුකම් සපුරාලිය යුතුය.**

I. ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම් ආඥා පනත යටතේ හෝ 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ පිරිසිදු කිරීමේ සේවය සැපයීමේ ආයතනයක් ලෙස පුවත්පත් දැන්වීම පළ වූ දිනට අවම වශයෙන් වර්ෂයකට පෙර ලියාපදිංචි වූ ආයතනයක් විය යුතුය.

II. පිරිසිදු කිරීමේ සේවය සැපයීම සම්බන්ධයෙන් රාජ්‍ය / අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පෞද්ගලික රෝහලක අවම වශයෙන් වසරක පළපුරුද්දක් තිබිය යුතු අතර, ඒ බව අදාළ ආයතනයට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ ලිපිය සමඟ සේවාව සැපයූ ආයතනයෙන් ලබා ගත් ලිපි සහ ගිවිසුම්වල සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතුය.

III. පොදු කොන්ත්‍රාත් පනතේ 08 වැනි වගන්තිය යටතේ වන ලියාපදිංචි සහතිකය

IV. පූර්වාසන්න වර්ෂය සඳහා තම ව්‍යාපාර ලියාපදිංචි නාමය යටතේ පිරිසිදු කිරීමේ සේවය සැපයීම වෙනුවෙන් සේවයේ යොදවනු ලැබූ සියළුම සේවකයින් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට දායක මුදල් ගෙවා ඇති බවට ශ්‍රී ලංකා මහ බැංකුවෙන්/ සේවක භාරකාර අරමුදලෙන් නිකුත් කළ ලිපි/ කුවිතාන්සි / ප්‍රේෂණ නිවේදන ඇතුළත් පසුගිය වසර 03 තුළ මාස 12කට අදාළ ගෙවීම් ලේඛන ඉදිරිපත් කළ යුතුය.

V. පූර්වාසන්න තක්සේරු වර්ෂය සඳහා පිරිසිදු කිරීමේ ආයතනය නමින් වැට් බදු/ආදායම් බදු ගෙවා ඇති බව ලිඛිත සාක්ෂි මඟින් තහවුරු කළ යුතුය.(සී/ස සමාගමක් නම් සමාගම නමින් ද, තනි පුද්ගල /හවුල් ව්‍යාපාර ආයතන සියළු හවුල්කරුවන්ගේ නමින් ද, පූර්වාසන්න වර්ෂය සඳහා ආදායම් බදු, වැට් බදු ගෙවා ඇති බවට ලිඛිත ලියවිලි ඉදිරිපත් කළ යුතුය. 2023/2024 වර්ෂය සඳහා පමණි )

VI. රු. 77,000.00 ක් වටිනාකමින් යුත් මුදල් තැම්පතුවක් හෝ ලංසු ආරක්ෂණයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති වාණිජ බැංකුවකින් හෝ රෝහලේ සරප් අංශය මගින් අධ්‍යක්ෂ, ශික්ෂණ රෝහල, පේරාදෙණිය නමට දින 105ක කාලයකට වලංගු වන සේ ලබාගෙන ලංසු ලියවිලි සමග ඉදිරිපත් කළ යුතුය.( 2025.04.17 දින සිට 2025.07.30 දින දකවා වලංගු විය යුතුය.) (මුදලින් ගෙවන්නේ නම් රෝහලේ සරප් අංශය වෙත ගෙවිය යුතුය.)

VII. රු. 1,918,092.90 ක අවම වටිනාකමකින් යුතු කොන්දේසි රහිත බැංකු අයිරා පහසුකම් ලබා දෙන බවට කොන්ත්‍රාත්කරු ගනුදෙනු කරන බැංකුවෙන් නිකුත් කළ ලිපිය (මුලි පිටපත) (කොන්ත්‍රාත්කරු විසින් රෝහල් / ආයතන කිහිපයකට මිල ගණන් ඉදිරිපක් කරනු ලබන්නේ නම් එම රෝහල් / ආයතනවල වටිනාකම්වල එකතුවට සමාන හෝ වැඩි වටිනාකමට ලබාගත් සහතිකයක් විය යුතුය.)

2. ලංසු ලියවිලි 2025.03.28 දින සිට 2025.04.17 දින දක්වා පේරාදෙණිය ශික්ෂණ රෝහලේ නිල වෙබ් අඩවිය වන www.peradeniya-hospital.health.gov.lk වෙතින් බාගත කර ගත හැකිය. ලංසු ලියවිලි ලබා ගැනීම සඳහා ආපසු නොගෙවන රු.1000.00 ක මුදලක් පේරාදෙණිය ශික්ෂණ රෝහලේ සරප් අංශය වෙත ගෙවීමෙන් හෝ මහජන බැංකුවේ අංක 057100129025207 දරණ රෝහල් ගිණුමට බැරකර අදාල ලදුපත ලංසු ලියවිලි සමග ඉදිරිපත් කළ යුතුය. (ආපසු නොගෙවන ලංසු ලියවිලි ගාස්තු වලට අදාල ලදුපත ලංසු ලියවිලි සමග ඉදිරිපත් නොකරන ප්‍රතික්ශේප කරනු ලැබේ.)

3. සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි 2025.04.17 දින **පෙ.ව. 10.30** ට පෙර ලැබෙන සේ සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, ශික්ෂණ රෝහල, පේරාදෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ පේරාදෙණිය ශික්ෂණ රෝහලේ ගණකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ භාරදීමට කටයුතු කළ යුතුය. ප්‍රසම්පාදන ලියවිලි බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "2025/2026 වර්ෂයේ පේරාදෙණිය ශික්ෂණ රෝහලට අනුයුක්ත ගලහා ජාතික භික්ෂු මධ්‍යස්ථානය සඳහා පිරිසිදු කිරීමේ සේවාව සැපයීම" යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. ලංසු ලියවිලි පිටපත් 02කින් මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවරවල බහා එම කවර දෙක තනි කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.

5. **2025.04.17** දින **පෙ.ව. 10.30 දක්වා** පේරාදෙණිය ශික්ෂණ රෝහලේදී ලංසු භාරගැනීම සිදු කෙරේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරන අතර, ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට ලංසු ලියවිලි විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී විය හැකිය. වැඩි විස්තර සඳහා පේරාදෙණිය ශික්ෂණ රෝහලේ පාලන අංශය අමතන්න. (දුරකථන අංක 0812388001 / 0812388002)

6. පූර්ව ලංසු රැස්වීම 2025.04.07 **දින පෙ.ව 10.30** ට පේරාදෙණිය ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂ කාර්යාලයේ දී පැවැත්වේ

7. ඉදිරිපත් වන ලංසු පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති,
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,
ශික්ෂණ රෝහල,
පේරාදෙණිය